

පාර්ලිමේන්තුව
මගහැර යාම
මන්ත්‍රීවරුන් 225

(සාමාන්‍යයෙන්
අයවැය
සම්මත
කරයි)

# ශ්‍රී ලංකාව ගමන් කරන්නේ ඒකාධිපතිවාදයක් දෙසටද?



**ගෝඨාභය රාජපක්ෂ**
ජනාධිපති



**මහින්ද රාජපක්ෂ**
අගමැති

අයවැයෙන් 50%ක් පාලනය කරයි
රාජ්‍ය ආයතන 88 යි



**චමල් රාජපක්ෂ**
ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන
අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍ය

රාජ්‍ය ආයතන 37 යි



**බැසිල් රාජපක්ෂ**
ජනාධිපතිගේ විශේෂ නියෝජිත

ආර්ථික කාර්ය සාධක බළකායේ
සභාපති



**මේජර් ජෙනරාල් (විශ්‍රාමික)**
**කමල් ගුණරත්න**
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්

අයවැයෙන් 10%ක් පාලනය කරයි
රාජ්‍ය ආයතන 31 යි
පුරාවිද්‍යා කාර්ය සාධක බළකායේ සභාපති
ගුණගරුක කාර්ය සාධක බළකායේ සභාපති



**මේජර් ජෙනරාල් (විශ්‍රාමික)**
**ජගත් අල්විස්**
ජාතික බුද්ධි සේවාවේ ප්‍රධානී



**මේජර් ජෙනරාල්**
**සුරේෂ් සලේ**
රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂ



**රියර් අද්මිරාල් (විශ්‍රාමික)**
**ආනන්ද පීරිස්**
අධ්‍යක්ෂ ජනරාල්,
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව



**මේජර් ජෙනරාල් (විශ්‍රාමික)**
**විජිත රවිප්‍රිය**
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව



**මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ශාන්ත දිසානායක**
සභාපති, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය



**මේජර් ජෙනරාල් (විශ්‍රාමික) සුමේධ පෙරේරා**
ලේකම්, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය
(චමල් රාජපක්ෂ යටතේ)



**මේජර් ජෙනරාල් (විශ්‍රාමික) සුදන්ත රණසිංහ**
අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
(ජනාධිපති යටතේ)



**හිටපු නාවික හමුදාපති**
**අද්මිරාල් (විශ්‍රාමික) ජයන්ත පෙරේරා**



**මේජර් ජෙනරාල් (විශ්‍රාමික) නන්ද මල්ලවාරච්චි**
අධ්‍යක්ෂ ජනරාල්, බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය
(ජනාධිපතිගේ පත් කිරීමකි)



**ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා**
වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී/
යුද හමුදාපති



**වයිස් අද්මිරාල් පියල් ද සිල්වා**
නාවික හමුදාපති



**එයාර් මාර්ෂල් සුමංගල ඩයස්**
ගුවන් හමුදාපති

**කාර්ය සාධක බලකායන්**
**සෘජුවම වාර්තා කරන්නේ**
**ජනාධිපතිටය**

(සියලුම රජයේ සේවකයන්
ඔවුන්ට සහාය දිය යුතුය)

- රාජපක්ෂ පවුල
- සුරක්ෂිත රටක්, විනයගරුක, ගුණගරුක හා නීතිගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය
- නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය
- ආර්ථික පුනර්ජීවනය සැලසීමේ සහ දරිද්‍රතාව තුරන් කිරීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය
- ත්‍රිවිධ හමුදා කඳවුරුවල සෞඛ්‍යාරක්ෂාව සහතික කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**2020 ජූලි 7**

**මාධ්‍ය නිවේදනය: ශ්‍රී ලංකාව - සමාන්තර රාජ්‍යයක්?**

**ජොහැන්නස්බර්ග්:** ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයෙන් තෝරා පත් කරගන්නා ලද පාර්ලිමේන්තුවකින් සාමාන්‍යයෙන් බලපැවැත්වෙන සංවරණ හා තුලන මගහැර යන හමුදකරණය වූ බලවත් කාර්ය සාධක බලකා යොදගනිමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ස්වාධීන අයකු සේ කටයුතු කරමින් ශ්‍රී ලංකාව පාලනය කරන ආකාරය අලුත් තොරතුරු රූපසටහනක් මගින් හෙළිදරව් කෙරේ[1]. සෘජුවම ජනාධිපතිවරයාට වාර්තා කරන ඡන්දයෙන් තෝරා පත් කරගෙන නැති මේ ආයතන වලට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය පූර්ණ සහාය ලබා දිය යුතු අතර ඒවා සාමාන්‍ය පරිද්දෙන් පාර්ලිමේන්තුවේ සුපරීක්ෂණයට හෝ අධීක්ෂණයට හෝ යටත් නොවේ. ලේකම්වරුන් පමණක් නොව, අමාත්‍යවරුන් (දැනට 16[2] කි) සහ අමාත්‍ය මණ්ඩල අනුකමිටු පවා ඡන්දයෙන් පත් නොවූ මේ ආයතන වලට සේවය කළ යුතු අතර, එසේ නොකරන්නේ නම්, නොකියැවුණු පල විපාක ඔවුන්ගේ වෘත්තියට අත් කර දෙමින් ඒ බව ජනාධිපතිවරයාට දැනුම් දෙනු ලබනු ඇත[3]. මෙය වඩාත් ගැටළු සහගත වන්නේ ව්‍යවස්ථාව වෙනස් කිරීම පහසු කරගැනීම පිණිස තුනෙන් දෙකේ බලයක් ලබා ගැනීම සඳහා ජනාධිපතිවරයා බලාපොරොත්තු තබා සිටින[4] එළැඹෙන මහ මැතිවරණය නිසාය.

*"කාර්ය සාධක බලකා මගින් සමාන්තර රාජ්‍යයක් බිහිවීමේ අවදනමක් ඇති අතර අනුග්‍රාහක ජාල සහ මහජන සම්පත් පාවිච්චිය සම්බන්ධයෙන් අසමාන පාලනයක් පවත්වාගෙන යාමට ජනාධිපතිට, ඔහුගේ පවුලේ සාමාජිකයන්ට සහ පැරණි හමුද සගයන්ට අවස්ථාව උදවීමේ ඉඩකඩක් පවතී,"* යි සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (ITJP) විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. *"වඩාත් ගැටළු සහගත වන්නේ රාජපක්ෂ පවුලට යටහත්, පහත් පාර්ලිමේන්තුවක් බලයට පත් කරනු ඇතැයි අපේක්ෂිත මහ මැතිවරණයෙන් පසුත්, බලය*

[1] *CONSTITUTION Art 33A.The President shall be responsible to Parliament for the due exercise, performance and discharge of his powers, duties and functions under the Constitution and any written law, including the law for the time being relating to public security.*
[2] http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=12&Itemid=18&lang=en
[3] "AND, I do hereby require and direct the said Task Force to report to me all instances where any Government employee or an officer in any Ministry, Government Department, State Corporation or any such Institution who delay the performance of duties and fulfilment of responsibilities or fail to perform such duties and responsibilities to be entrusted by the said Task Force." Task Force for Poverty Eradication and Livelihood Development Gazette Notification. This warning is included in every one of the gazette notifications.
[4] "Instead of pandering to the needs of NGOs and various interested parties at the international level, we must promulgate a new constitution that reflects the aspirations of our people." Manifesto: Vistas of Prosperity and Splendour, https://gota.lk/sri-lanka-podujana-peramuna-manifesto-english.pdf

*පවත්වාගෙන යාම සඳහා වන මේ අලුත් ක්‍රමවේදය දිගටම පවත්වාගෙන යාමට තිබෙන ඉඩකඩයි."*

තුන් මාසයකට වැඩි කලක් පාර්ලිමේන්තුව රැස් නොවීම හේතු කරගනිමින් ජනාධිපතිවරයා ආණ්ඩුවේ මුදල් වෙන්කරගෙන අතුරු සම්මත ගිණුමක[5] අයවැය සෘජුවම ප්‍රයෝජනයට ගන්නා බවට චෝදනා එල්ලවී තිබේ. ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලිත පුවත්පත් සහ වෙනත් මාධ්‍ය වාර්තා අනුව, මේ කාර්තුවේ අරමුදල් වලින් භාගයක් පමණ ඔහුගේ සහෝදර, අගමැති මහින්ද රාජපක්ෂ ගේ යටතේ ඇති අමාත්‍යංශ වලටත්, සියයට දහයක් මේජර් ජෙනරාල් කමල් ගුණරත්නගේ ප්‍රධානත්වයෙන් යුත් ආරක්ෂක අමාත්‍යාංශයටත් ලැබී ඇත. ඒ සම්බන්ධයෙන් කිසිදු ස්වාධීන අධීක්ෂණයක්[6] කෙරෙන බවක් දැනගන්නට නැත.

*"මේ අලුත්ම වර්ධනයන්ගෙන් සිදුකෙරෙන්නේ බලය මධ්‍යගත කොට ආකාරගත පත්වීම් ඔස්සේ දැනටමත් දැවැන්ත බලයක් භුක්ති විඳින ජනාධිපතිගේ මුල්පෙළේ හමුද සගයන්ට අසීමිත අධිකාරියක් පවරා දීමයි,"* යනුවෙන් ITJP විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. *"මේ සිදුවන්නේ 'රහසිගත රාජ්‍යය' එළිපිටට ඒමයි,"* යනුවෙන් ඇය වැඩිදුරටත් පැවසුවාය. *"මේ පාලන ව්‍යුහය සිහියට නංවන්නේ ජවිපෙ විනාශ කර දැමුණු 1989 දී ජනාධිපතිවරයා මාතලේ දැරූ සර්වබලධාරී දිස්ත්‍රික් හමුද සම්බන්ධීකාරක පදවියයි. ඒ නිර්බාධිත පාලන රටාව ඔහු විසින් සමස්ත ජාතිය මත්තේම නැවත යොදවන විලාසයක් දිස්වෙයි."*

කාර්ය සාධක බලකා පිහිටුවීම නෛතික වශයෙන් ප්‍රශ්නකාරී බවත්, පරිපාලනමය වශයෙන් අපැහැදිලි බවත් ශ්‍රී ලංකාවේ නීතිඥයන් විසින් තර්ක කරනු ලැබ ඇත[7]. කාර්ය සාධක බලකා වලට කාල නියමයක් නැති අතර, ඉංග්‍රීසියෙන් කෙටුම් පත් කර ඇති දෑ අවුල් සහගතය, ව්‍යාකරණ දෝෂ සහිතය[8]. *කාර්ය සාධක බලකාය* යන නමින් පවා යුදවාදය වහනය වන අතර කාර්ය සාධක බලකා නියෝග ක්‍රියාවේ යෙදවීමට පමණක් ඇතුලත් කර සිටින නිලධාරීන් හැරුනුකොට එම ආයතන පිරී පවතින්නේ හමුදමය, පුරුෂ, සිංහල හා ඡන්දයෙන් තෝරා පත් නොවූවන්ගෙනි.

### *රාජ්‍ය සේවක සාමාජිකයන්*

කාර්ය සාධක බලකාය වල ඇතැම් නිලධාරීන් දූෂණ වංචා සම්බන්ධයෙන් පසුගිය පාලන සමයේ විමර්ශනයට ලක්ව සිටියවුන් ලෙස වාර්තා වී ඇති බව මෙහිදී සටහන් කරනු වටී.

- *සුරක්ෂිත රටක්, විනයගරුක, ගුණගරුක හා නීතිගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ* ලේකම් වන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ඩී.එම්.එස් දිසානායකයි[9].

---

[5] State run media: https://www.dailynews.lk/2020/06/05/local/220068/rs1-trillion-govt-services-development-projects
Colombo Page: http://www.colombopage.com/archive_20A/Jun06_1591467379CH.php
Also Hiru news https://www.hirunews.lk/english/242355/budget-circular-for-three-months-up-to-august
Sri Lanka weekly news: https://www.srilankaweekly.co.uk/sri-lanka-president-authorizes-rs-1-trillion-consolidated-fund-run-government/
DBS Jeyaraj: http://dbsjeyaraj.com/dbsj/archives/69133
FT Lanka: http://www.newswire.lk/2020/06/06/president-authorises-rs-1-trillion-in-3rd-voa-daily-ft/
Sunday Morning: http://www.themorning.lk/general-elections-2020-prez-gets-key-to-consolidated-fund/
RS 546 bn of Rs 1043 goes to the Finance, Economic and Policy Development Ministry held by Prime Minister, Mahinda Rajapaksa. Rs 107 bn. to the MOD run by Kamal Gunaratne.
March- May 2020 reported in state run paper: http://www.dailynews.lk/2020/03/19/local/214821/president-authorises-rs1224-bn-consolidated-fund

[6] THE APPOINTMENT OF THE TWO PRESIDENTIAL TASK FORCES Discussion Paper, CPA, https://www.cpalanka.org/wp-content/uploads/2020/06/Commentary-Two-Task-Forces-CPA-Final.pdf "Thirdly, it is unclear how funds will be allocated to these Task Forces for the implementation of their functions. The Secretary of a Ministry is also its chief accounting officer, and since the Secretary to the Ministry of Defence is also the Chairperson of both these Task Forces, concerns regarding a conflict of interest are raised. This issue is compounded by the absence of oversight that can be provided by a functioning legislature. "

[7] See *"2. The use of Article 33 of the Constitution to establish Task Forces of this nature",* which says:
"This Article does not in fact give the President the wide power to set up bodies and bestow considerable powers on them as has been done with these Task Forces.", THE APPOINTMENT OF THE TWO PRESIDENTIAL TASK FORCES Discussion Paper, CPA, https://www.cpalanka.org/wp-content/uploads/2020/06/Commentary-Two-Task-Forces-CPA-Final.pdf

[8] CPA: "At the outset, CPA states that due to certain grammatical errors in the wording of the English versions of the Gazettes, the powers of the Task Forces are unclear."

[9] Dissanayake Mudiyanselage Saman Dissanayake. https://www.sasa.lk/member/2000065, https://www.newsradio.lk/local/npc-secretary-saman-dissanayake-arrested/
A DMS Dissanayake was suspect no 12 and referred to as having been Senior Assistant Secretary, Ministry of Defence. Some reports call him former Senior Additional Secretary MOD (https://www.onlanka.com/news/ag-instructs-acting-igp-to-arrest-chairman-of-avant-garde-and-seven-others.html )He later became secretary of the National Police Commission on 21.03.2018. http://www.npc.gov.lk/si/about/organizational-structure/
According to the English version of the site, he is no more the NPC secretary, http://www.npc.gov.lk/home/
But there is no report of his re-appointment to MOD as Senior Asst. Secretary in 2020, except in the gazette establishing the Task force and news reports thereof.
http://www.defence.lk/Article/defence_article/1688 which describes him as Defence Ministry's Senior Assistant Secretary (Civil Security and Development) Saman Dissanayake. He is not listed om the MOD page: http://www.defence.lk/About_us/contact_us but he would be junior to the Additional Secretary: http://www.defence.lk/About_us/organisational_structure . He

ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම්ව සිටියදී ස්ථාපිත කරන ලද ඇවන්ට් ගාර්ඩ් පාවෙන අවි ගබඩාව සම්බන්ධ එක නඩු විභාගයක සැකකරුවකු ලෙස ඩී.එම්.එස් දිසානායක නම් කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවේ අවධානය යොමුවී තිබුණි[10]. ගෝඨාභය රාජපක්ෂ යටතේ ආරක්ෂක අමාත්‍යාංශයේ රාජකාරි කළ ඩී.එම්.එස් දිසානායක අත් අඩංගුවට ගැනීමට නීතිපති වරයා 2019 දී නියෝග කළත්, පසුව චෝදනා ඉවත් කර ගන්නා ලදී[11].

- *ආර්ථික පුනර්ජීවනය සැලසීමේ සහ දරිද්‍රතාව තුරන් කිරීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය*

 මෙම වැදගත් ආර්ථික කාර්ය සාධක බලකායේ එක් ලේකම්වරයකු වන ඩී.එස් ජයවීර[12] ඇමරිකා එක්සත් ජනපදයේ විශ්ව විද්‍යාලයකින් ලබාගත් බව පවසමින් ව්‍යාජ ආචාර්ය උපාධි සහතිකයක් ඉදිරිපත් කිරීමේ චෝදනාවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් 2012 දී විමර්ශනය කරන ලද බව වාර්තාවී තිබේ[13]. ඔහු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ව සිටියදී රුපියල් මිලියන 5.7 ක් අවභාවිතය සම්බන්ධ චෝදනාවකටද නැවත 2016 දී විමර්ශනය කර තිබේ[14].

 තවත් සාමාජිකයකු වන විශ්‍රාමික භාණ්ඩාගාර ලේකම් එස්.බී දිවාරත්න යුද්ධයේ අවසන් දවස්වල අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ලෙස කටයුතු කරද්දී, වන්නියට ප්‍රමාණවත් ලෙස ආහාර නොයැවීම සම්බන්ධයෙන් විමර්ශනය කළ යුත්තෙකි. එක්සත් ජාතීන්ගේ වාර්තාවකින් චෝදනා කෙරෙන පරිදි ඒ හිතාමතා හාමතේ තැබීමකි[15]. 2009 දී ඝාතනය කරනු ලැබූ ලසන්ත වික්‍රමතුංග විසින් අනාවරණය කරන ලද මතබේදාත්මක මිග් ගනුදෙනුව සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ටෙන්ඩර් මණ්ඩලයේ ඔහු සාමාජිකයකුද විය[16]. සිය පියා 2009 දී ඝාතනය කිරීම සඳහා අණදීමට එවක ආරක්ෂක ලේකම් (වර්තමාන ජනාධිපති) වගකිවයුතු බවට චෝදනා කරමින් අහිම්සා වික්‍රමතුංග විසින් ගෝඨාභය රාජපක්ෂට එරෙහිව 2019 දී කැලිෆෝනියාවේ වන්දි නඩුවක් පවරන ලදී[17].

 අක්‍රමිකතා වලට සම්බන්ධ හෝ ඒ පිළිබඳව දැනසිටි හෝ බවට ශ්‍රී ලංකාවේ මාධ්‍ය විසින් චෝදනා නගනු ලබන තවත් සාමාජිකයන් දෙදෙනකුද සිටී. ඔවුහු එම චෝදනා ප්‍රතික්ෂේප කරති.

---

is however described here http://www.npc.gov.lk/si/about/organizational-structure/# in Sinhala as DM Saman Dissanyake, Asst. Secretary sports and youth affairs, National youth services director (admin), Dep controller immigration, Senior Asst. Secretary MOD, Director National Police Commission from 21.03.2018 .

10 http://www.dailymirror.lk/print/front_page/Avant-Garde-floating-armoury-case---AG-instructs-actg--IGP-to--arrest-NPC--Secretary/238-171299
"D.M.S. Dissanayake, Senior Assistant Secretary in the Defence Ministry and the officer-in-charge of Civil Security, has come under investigation over the controversy surrounding the Avant Garde Maritime Services Limited.
Dissanayake was said to be the official who wrote a letter to the Navy Commander to release the vessel containing a consignment of arms for Avant Garde Maritime Services Limited. Highly placed sources from the Defence Ministry told the Daily News that the ministry would investigate whether the senior official actually had a "mandate" to issue a letter of that nature, seeking the release of the vessel."
https://www.onlanka.com/news/avant-garde-vessel-matter-dissanayake-under-probe.html

11 http://www.adaderana.lk/news.php?nid=56218

12 He is part of the 4- member Committee appointed to review the proposed Millennium Challenge Corporation Compact (MCC).
http://www.dailynews.lk/2020/02/18/local/211779/preliminary-report-mcc-presented-president?page=1

13 Bribery Commission interrogates top Finance Ministry official Over allegation of bogus doctorate from US University, January 14, 2012. http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=43235

14 SRI LANKA: FINANCIAL FRAUD CASES SOON AGAINST FORMER SL STATE OFFICIALS INCLUDING GOTABHAYA AND PBJ, 18 Feb 2016,
https://srilankabrief.org/2016/02/sri-lanka-financial-fraud-cases-soon-against-former-sl-state-officials-including-gotabhaya-and-pbj/
Also: https://srilankabrief.org/2016/03/details-of-the-22-investigations-into-rajapaksa-regimes-crimes-concluded-by-the-fcid/

15 "On 20 November 2008, noting that requests by the United Nations and international NGOs for transporting humanitarian assistance were largely based on requests from Government Agents, the Commissioner General of Essential Service prohibited the agents of Vavuniya, Mullaitivu and Killinochchi from making any further requests for food and non-food items to United Nations agencies and international NGOs, and instructed that all requests had to be processed through him – OISL para 946.
OISL para 1169: "OISL has reasonable grounds to believe that the Government knew or had reasons to know the real humanitarian needs of the civilian populations in the concerned areas, including from its own Government agents who were organizing assistance in the conflict zone, and yet it imposed severe restrictions on the passage of relief and the freedom of movement of humanitarian personnel. This apparently resulted in depriving the civilian population in the Vanni of adequate basic foodstuffs and medical supplies essential for their survival, which has been well documented. If established by a court of law, these acts and omissions point to violations of international humanitarian law, which, depending on the circumstances, may amount to the use of starvation of the civilian population as a method of warfare, which is prohibited under international humanitarian law."
Wikileaks: "At the Minister's request Commissioner General for Essential Services Divaratne briefed on GSL humanitarian efforts. He indicated that the Government Agents of Kilinochchi and Mullaitivu had briefed the Government on October 23 that there was sufficient quantities of food in the north and that the supply and distribution of the food is good."
https://wikileaks.org/plusd/cables/08COLOMBO985_a.html

16 http://www.sundayobserver.lk/2019/02/14/news-features/more-bombs-drop-%E2%80%98mig-deal%E2%80%99

17 https://cja.org/what-we-do/litigation/wickrematunge-v-rajapaksa/client/
https://cja.org/what-we-do/litigation/wickrematunge-v-rajapaksa/

- *ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය මහජන සේවාවන් සැපයීම, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම් කටයුතු වෙනුවෙන් පිහිටුවන ලද,* දැනට ක්‍රියාත්මක නොවෙන ජනාධිපති කාර්ය සාධක බලකායට පහත දැක්වෙන අයද ඇතුලත් විය.

  ශ්‍රී ලංකාවේ මාධ්‍ය වාර්තා අනුව, දණ්ඩ නීති සංග්‍රහය, මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ පනත සහ මහජන දේපල පනත[18] යටතේ 2016 දී අත් අඩංගුවට ගන්නා ලදුව පසුව රාජ්‍ය දේපල අවභාවිතාව පිළිබඳ චෝදනා වලින් 2019 අගෝස්තුවේදී නිදහස් කරන ලද[19] අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂගේ ලේකම් ගාමිණී සේදර සෙනරත්.

  තවත් සාමාජිකයකු වූයේ අගමැති මහින්ද රාජපක්ෂ යටතේ වගකීම් පැවරෙන නාගරික සංවර්ධන, ජලසම්පාදන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය ප්‍රියත් බන්දු වික්‍රමයි[20]. ඔහු වරාය අධිකාරියේ සභාපති ලෙස සිටියදී 2014 ඔක්තෝබර් 20 සහ 2015 ජනවාරි 7 අතර කාල සීමාවේදී සේවකයන් 319 ක් නීති විරෝධී ලෙස මැතිවරණ රාජකාරියේ යෙදවූ බවට අල්ලස් කොමිසම විසින් චෝදනා නැගීමෙන් පසු 2019 දී දූෂණ වංචා නඩුවකට මුහුණ දී සිටියේය[21]. මෙම නඩුවේ අවසාන ප්‍රතිපලය අවිනිශ්චිතය.

පසුගිය රජය විසින් ආරම්භ කරන ලද පළමු රාජපක්ෂ ආණ්ඩුවේ (2005-2015) නිලධාරීන්ගේ දූෂණ වංචා පිළිබඳ විමර්ශන දැන් දේශපාලන පලිගැනීම් චෝදනා සොයාබැලීම සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරන ලද කොමිසම විසින් විමර්ශනය කෙරෙමින් පවතින බව මෙහිදී සඳහන් කිරීම වටී[22]. මීට අමතරව, 2019 නොවැම්බරයේ පවත්වන ලද ජනාධිපති මැතිවරණය ආසන්නයේදී සැකකරුවන් කිහිප දෙනකුට එරෙහි චෝදනා ඉවත් කරගන්නා ලදී.

---

[18] https://www.dailynews.lk/2018/10/16/law-order/165633/case-against-gamini-senaraththree-others-fixed-october-23

[19] Gamini Senarath acquitted and released from charges of misappropriating State funds, 9 Aug 2019, http://www.ft.lk/front-page/Gamini-Senarath-acquitted-and-released-from-charges-of-misappropriating-State-funds/44-683653
https://www.newsradio.lk/local/gamini-senarath-acquitted-of-all-charges/
https://srilankabrief.org/2015/07/mrs-aide-faces-money-laundering-charges/
http://caffesrilanka.org/posters/160315070324ACF%20%20Report%20%23%20152%20--%20%20Files%20with%20the%20AGs%20department.pdf
https://srilankabrief.org/2016/03/details-of-the-22-investigations-into-rajapaksa-regimes-crimes-concluded-by-the-fcid/
Named in http://caffesrilanka.org/posters/160315070324ACF%20%20Report%20%23%20152%20--%20%20Files%20with%20the%20AGs%20department.pdf
https://srilankamirror.com/news/9953-64-witnesses-in-case-against-gamini-senarath
https://www.dailynews.lk/2018/10/16/law-order/165633/case-against-gamini-senaraththree-others-fixed-october-23

[20] "Priyath Bandu Wickrama has been appointed as Secretary to the Ministry of Urban Development, Water Supplies and Housing Facilities, a portfolio held by Prime Minister Mahinda Rajapaksa." http://www.ft.lk/front-page/Ex-SLPA-Chief-now-Urban-Development-and-Housing-Secretary/44-69054

[21] http://www.dailynews.lk/2019/11/02/law-order/201730/further-trial-fixed-jan-28
http://www.dailynews.lk/2017/04/26/law-order/114203/case-against-former-slpa-chairman-priyath-fixed-trial
He is now involved in the planned construction of a new cricket stadium https://colombogazette.com/2020/05/17/sri-lankas-biggest-cricket-stadium-to-be-constructed-in-homagama/
State run newspaper on him arriving at The Presidential Commission Investigating into Mass Scale Corruption and Frauds: https://dailynews.lk/2016/09/24/law-order/93973.
He was also questioned by the Financial Crimes Investigation Division of the police in 2016 in connection with alleged tax fraud.
https://www.asianmirror.lk/keyhole/item/14652-dr-priyath-bandu-wickrema-in-hot-water-over-multi-million-alleged-tax-fraud-involving-csn , "Dr. Priyath Bandu Wickrema In Hot Water Over Multi-million Alleged Tax Fraud Involving CSN:".
He was also a member of the board of directors of a Chinese company that allegedly made a donation to Mahinda Rajapaksa's 2015 election campaign though he has denied being aware of the alleged contribution. ("Meanwhile according to the 'B' Report submitted to Fort Magistrate Court (Case No: B 586/15) by the Financial Crime Investigation Division (FCID), when questioned, former Chairman SLPA Priyath Bandu Wickrema and Managing Director SLPA, Nihal Keppettipola, have both stated that although they were in the CICT Director Board during the time, the 'donation' had been made to Pushpa Rajapaksa Foundation in 2012, they were unaware of the payment nor had they discussed the matter at a Board Meeting.")
http://www.dailymirror.lk/expose/Questionable-Donation-from-CICT/333-152833
New York Times:
"At least $7.6 million was dispensed from China Harbor's account at Standard Chartered Bank to affiliates of Mr. Rajapaksa's campaign, according to a document, seen by The Times, from an active internal government investigation. The document details China Harbor's bank account number — ownership of which was verified — and intelligence gleaned from questioning of the people to whom the checks were made out.
With 10 days to go before polls opened, around $3.7 million was distributed in checks: $678,000 to print campaign T-shirts and other promotional material and $297,000 to buy supporters gifts, including women's saris. Another $38,000 was paid to a popular Buddhist monk who was supporting Mr. Rajapaksa's electoral bid, while two checks totaling $1.7 million were delivered by volunteers to Temple Trees, his official residence.
Most of the payments were from a subaccount controlled by China Harbor, named "HPDP Phase 2," shorthand for Hambantota Port Development Project."
https://www.nytimes.com/2018/06/25/world/asia/china-sri-lanka-port.html

[22] http://www.dailynews.lk/2020/01/11/local/208087/president-appoints-high-powered-commission-probe-previous-govt

### *හමුදා සාමාජිකයන්*

සැලකිල්ලට ගතයුතු කාරණයක් වන්නේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ගේ අභ්‍යන්තර කවයේ සාමාජිකයන්[23] ආණ්ඩුවේ වෙනත් බලසම්පන්න නිලතල දරමින්ම කාර්ය සාධක බලකා දෙක තුනකම[24] තනතුරු දැරීමයි.

- විශ්‍රාමික මේජර් ජනරාල් කමල් ගුණරත්න අලුත් කාර්ය සාධක බලකා දෙකකම සභාපති වරයායි[25]. ඔහු ආරක්ෂක ලේකම්ද වන අතර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ බලයට පත්වූ පසු ප්‍රධාන රාජ්‍ය ආයතන 31ක් ඔහු යටතට පවරන ලදී.

- විශ්‍රාමික මේජර් ජෙනරාල් සුමේධ පෙරේරා වර්තමාන කාර්ය සාධක බලකා දෙකක සාමාජිකයෙකි[26]. රජයේ අත් අඩංගුවේ සිටි සිංහලයන් 700ක අතුරුදහන් වීම් ගැන වාර්තා කෙරෙන බවට චෝදනා නැගෙන සමයක ඔහු 1989 ගෝඨාභය රාජපක්ෂ යටතේ ගජබා රෙජිමේන්තුවේ සේවය කළේ ජනාධිපතිවරයා මාතලේ දිස්ත්‍රික් හමුදා සම්බන්ධීකාරක වශයෙන් සිටියදී ය[27].

- ගෝඨාභය රාජපක්ෂ යටතේම මාතලේ රාජකාරි කළ ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා, රටේ ජ්‍යෙෂ්ඨතම හමුදා නිල දෙකක් දරා සිටියදීම කාර්ය සාධක බලකා දෙකක අසුන් ගෙන සිටී. ඔහු ගෝඨාභය රාජපක්ෂ බලසම්පන්න ආරක්ෂක ලේකම් වශයෙන් කටයුතු කළ 2009 යුද්ධයේ 58 සේනාංකයේ ආඥාපති ලෙස ප්‍රමුඛ නිලධාරියකු විය. බරපතල මානව හිමිකම් උල්ලංඝන චෝදනා සම්බන්ධයෙන් ඇමරිකා එක්සත් ජනපද ආණ්ඩුව විසින් ඔහු නම්කොට තිබේ[28].

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ විශ්වාසවන්ත ප්‍රධානතම උප සෙනෙවියන් වන්නේ යුද හමුදාව[29], ආරක්ෂක අමාත්‍යාංශය[30], බුද්ධි සේවාව[31], ප්‍රධාන පොලිස් දෙපාර්තමේන්තු[32], රේගුව[33], වරාය[34], බන්ධනාගාර වෘත්තීය පුහුණුව[35] ආදී ආයතනවල පාලනය හසුරුවන ආණ්ඩුවේ තීරණාත්මක තනතුරු දරන්නන්ය.

### *පවුල*

මීට අමතරව, ජනාධිපතිගේ සහෝදරයන් අතරින් තුන් දෙනෙක්ම සෘජුවම රට පාලනයේ නිරතව සිටිති.

- මහින්ද රාජපක්ෂ අගමැති මෙන්ම මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු

---

[23] Inner Circle infographic : https://itjpsl.com/assets/ITJP_appointments_A3_v4.7.pdf

[24] Three is if you include the (1) Task Force for Poverty Eradication and Livelihood Development and (2) the Presidential Task Force to direct, coordinate and monitor the delivery of continuous services for the sustenance of overall community life which were later replaced by the Presidential Task Force for Economic Revival and Poverty Eradication.

[25] Gazette Notification No. 2153/12 - TUESDAY, DECEMBER 10, 2019 on the subjects and functions and Departments, Public Corporations & Statutory Institutions in the charge of various Ministers.
Kamal Gunaratne was in the Presidential Task Force to direct, coordinate and monitor the delivery of continuous services for the sustenance of overall community life (2), and now chairs the Presidential Task force for Archaeological Heritage Management in the Eastern Province (7) and the *Presidential Task Force to build a Secure Country, Disciplined, Virtuous and Lawful Society (6).*

[26] Task Force for Poverty Eradication and Livelihood Development (lapsed)
Presidential Task Force to direct, coordinate and monitor the delivery of continuous services for the sustenance of overall community life (lapsed)
Presidential Task Force in charge of Economic Revival and Poverty Eradication
Presidential Task Force to ensure the health safety within camps of the tri-forces

[27] Numbers extracted from cases reported to the Zonal and All Island Commissions of Inquiry in Sri Lanka.

[28] https://www.state.gov/public-designation-due-to-gross-violations-of-human-rights-of-shavendra-silva-of-sri-lanka-under-section-7031c-of-the-department-of-state-foreign-operations-and-related-programs-appropriations-a/

[29] Shavendra Silva.

[30] Kamal Gunaratne.

[31] Maj Gen Jagath Alwis, T. Suresh Sallay.

[32] Prasanna de Alwis.

[33] Major General Vijitha Ravipriya.

[34] Major General Daya Ratnayake.

[35] Nissanka Senadhipathi, https://www.dailynews.lk/2020/02/08/local/210827/avant-garde-rs1-bn-project-train-vocational-skills-employ-5000-prison

අමාත්‍ය, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍ය, ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍ය හා ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය ද වෙයි.

- චමල් රාජපක්ෂ ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය, අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍ය වෙයි.

- බැසිල් රාජපක්ෂ ආර්ථික කාර්ය සාධක බලකායේ ප්‍රධානියාය. ඔහුට විරුද්ධවද දූෂණ වංචා චෝදනා යටතේ පසුගිය ආණ්ඩුව විසින් විමර්ශන පහක් සිදු කෙරුණි[36]. ශ්‍රී ලංකා, එක්සත් ජනපද ද්විත්ව පුරවැසියකු වන ඔහු මහජන ඡන්දයෙන් පත් කරගන්නා ලද අයකු නොවුවත් ජනාධිපතිගේ විශේෂ නියෝජිතයා ලෙස කටයුතු කරයි.

කාර්ය සාධක බලකා පත් කිරීමට පෙර, දේශීය ප්‍රවෘත්ති වාර්තා වල දැක්වුණු පරිදි රාජපක්ෂ සහෝදරයන්ගේ පාලනය යටතේ තිබුණු රාජ්‍ය ආයතන සංඛ්‍යාව 145 කි - මහින්ද රාජපක්ෂට පමණක් 88කි[37]. මෙසේ සිදුවන්නේ ගෝඨාභය රාජපක්ෂගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ *"සියලු ම රාජ්‍ය ආයතන ප්‍රධානීන්, සංස්ථා සභාපතිවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස නායකත්ව හැකියාවෙන් යුත්, විෂය පිළිබඳ මනා දැනුමක් ඇති, සුදුසුකම් හා අත්දැකීම්වලින් පරිපූර්ණ සහ ක්‍රියාශීලී පිරිසක් පත් කරන නව ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ,*[38]*"* යි සඳහන්ව තිබියදීය.

මහ මැතිවරණයෙන් පසු බලය ඒකරාශී කරගැනීමත් සමග ශ්‍රී ලංකාවේ අලුත් ආණ්ඩුවේ ගතිලක්ෂණය වනු ඇත්තේ පවුල්වාදය, අනුග්‍රාහකත්වය සහ හමුදාකරණයයි.

**නිමයි**

**<u>ජනාධිපති කාර්ය සාධක බලකා ලැයිස්තුව</u>**

1. දරිද්‍රතාව තුරන් කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා වන කාර්ය සාධක බලකාය.
2. ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය මහජන සේවාවන් සැපයීම, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම් කටයුතු වෙනුවෙන් වූ ජනාධිපති කාර්ය සාධක බලකාය.
3. **1 හා 2 වෙනුවට:** ආර්ථික පුනර්ජීවනය සැලසීමේ සහ දරිද්‍රතාව තුරන් කිරීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය[39].
4. ත්‍රිවිධ හමුදා කඳවුරුවල සෞඛ්‍යාරක්ෂාව සහතික කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය[40].

---

[36] http://caffesrilanka.org/posters/160315070324ACF%20%20Report%20%23%20152%20--%20%20Files%20with%20the%20AGs%20department.pdf

1. The Ministry of Economic Development initiated a program called "Yali Pubudamu" or Rise Again in which it was alleged that there were financial irregularities.
2. Financial irregularities allegedly in the "Isurumath Nivahanak" project conducted by the Divineguma Department under the Ministry of Economic Development involving SLR 2990 Million.
3. Financial fraud during a national meeting of the Divineguma Department in 2014 for obtaining and using SLR 63.7 Million without Treasury approval.
4. Illegally diverting and utilizing SLR 19.4 Million (US$ 15,000) of fund suspected to be from the Sri Lankan Ports Authority to the Pushpa Rajapaksa Foundation at the Main Branch of the Peoples Bank of Sri Lanka.
5. Case Number 8674/15 in Pugoda M.C. regarding Economic Development Projects

This article alleges some of the cases stalled at the Attorney General's department: https://newsfirst-staging.3cs.support/2017/05/long-pause-police-fcid-investigations-conclude/

[37] The Unravelling, 16 Dec 2019, FT Lanka, http://www.ft.lk/columns/The-Unravelling/4-691664

[38] Vistas of Prosperity and Splendour, P7.

[39] https://news.lk/news/political-current-affairs/item/30031-president-appoints-presidential-task-force-for-economic-revival-and-poverty-elevation

[40] https://news.lk/news/political-current-affairs/item/30048-special-task-force-established-to-ensure-safety-of-military-camps

5. අධ්‍යාපන කටයුතු කාර්ය සාධක බලකාය[41].
6. සුරක්ෂිත රටක්, විනයගරුක, ගුණගරුක හා නීතිගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය.
7. නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය.
8. බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය[42] (ජනාධිපති කාර්ය සාධක බලකායක් නොවෙතත් ජනාධිපති විසින් පත් කරන ලද්දකි).

[41] http://documents.gov.lk/files/egz/2020/4/2173-07_E.pdf https://www.dailynews.lk/2020/04/29/local/217554/task-force-education-appointed
Reported earlier http://www.ft.lk/news/President-appoints-Education-Task-Force-to-deal-with-interruptions-due-to-COVID-19/56-698494
https://ceylontoday.lk/news-more/13468

[42] http://www.pmdnews.lk/%E0%AE%93%E0%AE%AF%E0%AF%8D%E0%AE%B5%E0%AF%81%E0%AE%AA%E0%AF%86%E0%AE%B1%E0%AF%8D%E0%AE%B1-%E0%AE%AE%E0%AF%87%E0%AE%9C%E0%AE%B0%E0%AF%8D-%E0%AE%9C%E0%AF%86%E0%AE%A9%E0%AE%B0%E0%AE%B2%E0%AF%8D/

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT